රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி / Telephone: **(94) 011- 2694560**
ෆැක්ස් / தொலைநகல் / Fax: **(94) 011- 2692254**
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: **dgcs@pubad.gov.lk**
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: **www.pubad.gov.lk**

මගේ අංකය / எனது இல / My No: COM/TRANS/V/වා.ස්.මා./2023
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.11.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම.**
**රජයේ භාෂා පරිවර්තක සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය, සංවර්ධන නිලධාරී සේවය, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය, කළමනාකරණ සේවා නිලධාරී සේවය, ඒකාබද්ධ රියදුරු සේවය, කාර්යාල සේවක සේවය.**

මගේ සමාංක හා 2022.10.14 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කළ 2023 වාර්ෂික ස්ථාන මාරු තීරණ හා එම ලිපියේ සඳහන් කරුණු වලට ඔබගේ කාරුණික අවධානය යොමු කරනු ලැබේ.

02. එම ස්ථාන මාරු යෝජනා සම්බන්ධව මා වෙත ඉදිරිපත් වූ කරුණු දැක්වීම් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 210 සහ 211 වගන්ති අනුව වූ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ මේ සමඟ ඉදිරිපත් කරමි. මෙමඟින් සිදු කරනු ලැබූ සංශෝධනයන්ට යටත්ව ඉහත සඳහන් සේවාවල නිලධාරීන් සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2022.10.14 දිනැති ලිපිය මගින් යෝජිත 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග මෙයින් අනුමත කරමි.

03. **ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් වන අභියාචනා :**

(අ) ස්ථාන මාරු නියෝගයන් සම්බන්ධයෙන් අතෘප්තියට පත් නිලධරයන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති XX වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැක. අභියාචනා *ඉදිරිපත් කිරීම සඳහා අන්තර්ජාලයට පිවිසීමට භාවිතා කරනු ලබන්නේ,*

- *LGN Wi-Fi ජාලය නම්* http://10.250.1.112:7009 ඔස්සේ ද
- වෙනත් ජාලයක් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සලසා ගන්නේ නම් http://43.224.125.68:7009 ඔස්සේ ද,

මාර්ගගත මෘදුකාංග (Online Application) තුළට පිවිස, **තම අභියාචනය 2022.11.30 දිනට පෙර ඉදිරිපත් කළ යුතු අතර එදිනට පසුව ඉදිරිපත් කරන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

(ආ) **සමාලෝචන කමිටුවට අභියාචනා ඉදිරිපත් කළ නිලධරයන්ට පමණක්** රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මාර්ගගත ක්‍රමය ඔස්සේ අභියාචනා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහි මුද්‍රිත පිටපතක් තම **දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් මා වෙත** එවිය යුතුය. ඒ සමඟම අභියාචනයෙහි සඳහන් කරුණු සනාථ කිරීමට අදාළ ලේඛන ද අමුණා එවන්නේ නම් මැනවි.

04. **වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම.**

2023 වර්ෂය සඳහා වූ ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි වෙනස්කම් වලට යටත්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන දින සිට හෝ අදාළ ස්ථාන මාරු නියෝගවලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට පහත පරිදි ක්‍රියාත්මක වේ.

**(අ) 2023 වාර්ෂික ස්ථානමාරු ලේඛනයේ හා සමාලෝචන කමිටු තීරණ යටතේ 2023.01.02 සිට ක්‍රියාත්මක වන සේ අනුමත කරන ලද ස්ථානමාරු හා අදාළ නිලධාරියාගේ නම ඉදිරියෙන් ස්ථානමාරුව ක්‍රියාත්මක වන දිනය සටහන්කර නොමැති ස්ථානමාරු, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ.**

**(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන දිනට පසු එළඹෙන දිනයන් සඳහන්ව ඇති අනෙකුත් නිලධාරීන්ගේ ස්ථානමාරු, වාර්ෂික ස්ථානමාරු ලේඛනයේ හෝ සමාලෝචන කමිටු තීරණ යටතේ නිලධාරියාගේ නම ඉදිරියේ දක්වා ඇති දින සිටම ක්‍රියාත්මක වේ.**

ඒ අනුව ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ සේවය කරන, ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධරයන් නියමිත දිනයේ නව සේවා ස්ථානයන්හි රාජකාරි බාර ගැනීමට හැකිවන පරිදි අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන මුදා හැරීමට ක්‍රියාකරන ලෙස දන්වා සිටිමි.

**05. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධාරියෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ / කාර්යාලයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 217 වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතු බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදුකර මා වෙත දැන්විය යුතුය.**

06. 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව නව සේවා ස්ථානයට වාර්තා කරන නිලධරයන්ද, මුදාහළ නිලධරයන්ද, පිළිබඳව මේ සමඟ වන ඒ.සේ/වා.ස්.මා/ 07, සහ ඒ.සේ/වා.ස්.මා/ 08 ආකෘති මඟින් **ස්ථාන මාරු ක්‍රියාත්මක වන දින සිට මාස 02 ක් ඇතුළත** මා වෙත වාර්තා කළ යුතුය. ඒ සමඟ අදාළ නිලධරයන් සේවයට වාර්තා කළ බවට හා මුදාහළ බවට වන ලිපිවල පිටපත්ද ඉදිරිපත් කළ යුතුය. (ඒ.සේ/වා.ස්.මා/ 05, හා ඒ.සේ/වා.ස්.මා/ 06)

07. 2023 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ මා විසින් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගවලට අමතරව අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග යටතේ කිසියම් නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් ලැබී තිබුනේ වුවද, මෙම සමාලෝචන කමිටු තීරණවලින් වූ සංශෝධන වලට යටත්ව 2022.10.14 දිනැති වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු බව සැලකීම මැනවි.

08. තවද 2023 වාර්ෂික ස්ථාන මාරු තීරණ ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශ වෙනස් වීම හේතුවෙන් යම් නිලධාරියෙක් ස්ථාන මාරු විය යුතු සේවා ස්ථානය පිළිබඳ ගැටළුවක් පවතී නම්, එවැනි අවස්ථාවලදී **අනුප්‍රාප්තිකයා වශයෙන් සලකනු ලබන නිලධාරියාගේ වර්තමාන සේවා ස්ථානය, අදාළ නිලධාරියාගේ නව සේවා ස්ථානය විය යුතු බව දන්වමි.**

09. එමෙන්ම ඔබ ආයතනයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ ඒකාබද්ධ සේවයේ නිලධරයන් වෙත ලබාදී ඇති මෙතෙක් ක්‍රියාත්මක නොවූ 2022 වාර්ෂික ස්ථාන මාරු නියෝගද නොපමාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්